2nd International Conference of Multidisciplinary Approaches (iCMA), 2015
Faculty of Graduate Studies,
University of Sri Jayewardenepura,
Sri Lanka
ISSN: 2386 – 1509
Copyright © iCMA


# ත්‍රිපිටකයෙන් පිළිබිඹුවන බුදුන්වහන්සේගේ වෛදික ඥානය

**වැල්පලවාකේ නන්දරතන හිමි**

*භාෂා, සංස්කෘතික අධ්‍යයන හා ප්‍රාසංගික කලා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය*

*nandarathanaw@yahoo.com*

*ක්‍රි: පූ: 06 වනසියවසේ භාරතයේ පහළවූ ශ්‍රේෂ්ඨ දාර්ශනිකයකු ලෙෂ බුදුන්වහන්සේ පෙන්වාදිය හැකි ය. උන්වහන්සේ සිද්ධාර්ථ චරිතයෙන් සමුගෙන තිස්පස්වන වියේදී උතුම් සම්මා සම්බුද්ධත්‍වයට පත්වූහ. උන්වහන්සේ ගිහි ගෙයින් නික්ම ගියේ සාම්ප්‍රදායික කාලීන ජනයා අතර ජීවත්වූමෙන් ම කාලීන දර්ශනවාදයන් පිළිබඳ අවබෝධයකින් පසුවූ තැනත්තු වශයෙනි. එසේ නික්මයෑමෙන් අනතුරුව අප්‍රමාන ව්‍යායාමයකින් සැග ව පැවති සත්‍යය සොයා ගන්නා ලදි. එතැන් පටන් ලෝක සත්ත්වයාට ධර්මය දේශනා කිරීම ආරම්භ කළ උන්වන්සේ සාම්ප්‍රදායික සමාජ ජන විඥානය අධ්‍යයනය කොට එයට ගැලපෙන අයුරින් ධර්මය ප්‍රචාරය කිරීමට උත්සහ කළ ආකාරයක් ත්‍රිපිටකයෙන් විශදවේ. ඒ මගින් කිසිඳුවිට අර්ථවත් වන්නේ බුදුන්වහන්සේ පරායත්ත ධර්මයක් දේශනා කළබව නොව. සාම්ප්‍රදායිකජනවිඥානය මැනවින් ස්පර්ශ කරන්නට ගත් ව්‍යායාමයක ප්‍රතිඵලයකි. එහිදී බුදුන්වහන්සේ සිය වෛදික ඥානය සිය දේශනාවන් සඳහා උපයෝගි කොටගෙන කාලීන ජනයාට ත්‍රිපිටකධර්මය පිළිබඳ මනා අවබෝධයක් ලබාදෙන්නට උත්සාහකොට ඇත. එයට ප්‍රමාණවත් සාධක ත්‍රිපිටකයෙන් හමුවේ. යථෝක්ත කාරණාව පිළිබඳ අවධානය යොමුකිරීමේදී වෛදික දේවමණ්ඩලය පිළිබඳ මනාඅවබෝධයක් බුදුන්වහන්සේට තිබී ඇත. සංයුත්ත නිකායේධජග්ග සූත්‍රය, දීඝනිකායේ සක්කපඤ්හ සූත්‍රය, දීඝනිකායේ මහාසමයසූත්‍රය වැනි සූත්‍ර එයට කදිම නිදසුන් ය. වෛදිකසූක්ත රචකයන් සම්බන්ධ ව ද ත්‍රිපිටකයෙන් සාදක හමුවේ. මජ්ඣිමනිකායේ වඞ්කීසූත්‍රය, සුභසූත්‍රය වැනි සූත්‍රයන් එහිලා ප්‍රබල සාධක ය. දීඝනිකායේ තේවිජ්ජක සූත්‍රයේ බ්‍රාහ්මණ ග්‍රන්ථ පිළිබඳ නාමයන් දැකිය හැකි ය. සුත්ත නිපාතයේ තුවටක සූත්‍රයේ සඳහන්වන “ආථබ්බන” යන්න කාලීන වශයෙන් අථර්වන් වේදය සඳහා භාවිත නාමය වන්නට පුළුවනි. දීඝනිකායේ බ්‍රහ්මජාල සූත්‍රයේ සඳහන්වන ගුප්ත විද්‍යාවන් පිළිබඳ දේශනාව අථර්වන් වේදයේ ගුප්ත විද්‍යාවන් සමග සාම්‍යතාවක් දක්වයි. මීට අමතර ව නොයෙක් බ්‍රාහ්මණයන් සමග කළ සාකච්ඡාවලදී සිය වෛදික ඥානය මැනවින් බුදුන්වහන්සේ උපයෝගිකොටගෙන ඇත. මෙවන් සාදක අනුව බුදුන්වහන්සේ වේද සාහිත්‍යය පිළිබඳ යථාවබෝධයකින් පසුවූ තැනත්තකු බව පෙනීයයි. එහිලා උක්ත සාධකයන් මෙන් ම තවත් සාදක ත්‍රිපිටකයෙන් පහසුවෙන් සොයා ගැනීමට අපහසු නැත. එහෙයින් මෙහි අරමුණ වන්නේ භාරතයේ පහළවූ බුදුන්වහන්සේ භාරතයේ පැවති වේදසාහිත්‍යය පිළිබඳ මනාඅවබෝධයකින් පසුවූ තැනත්තකු ද යන්න විමසාබැලීම ය.*

ප්‍රමුඛපද :- ත්‍රිපිටක, වේද, බ්‍රාහ්මණ